# ශ්‍රී ලංකාවේ උපාධිධාරියා සහ රැකියා

**පී. එන්. ඩී. ඒ. සෝමසිරි**[1]

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාව තුළ පවතින වඩාත් තීරණාත්මක කඩඉම් විභාගය වන අ.පො.ස(උ.පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල වරම් ලබා ගන්නා සිසුන් ප්‍රමාණය වර්තමානය වන විට ඉහළ යාමක් හඳුනා ගත හැකිය. එමෙන්ම වර්තමානය වන විට විශ්වවිද්‍යාල ප්‍රවේශය ද යම් ප්‍රමාණයකින් ඉහළ දැමීමට කටයුතු සිදු කර තිබෙන හෙයින් ඒ තුළින් හා බාහිර උපාධි ආශ්‍රයෙන් බිහි වන උපාධිධාරීන් ප්‍රමාණය අතිමහත් ය. නමුත් මෙලෙස බිහි වන උපාධිධාරීන්ට තම රැකියා ක්ෂේත්‍රය තුළ තම අධ්‍යයනයන් භාවිතයට ගැනීමට අවස්ථාව හිමිවේද යන්න ගැටලුකාරී තත්ත්වයක් වශයෙන් හඳුනා ගත හැකි ය. මෙම ගැටලුකාරී තත්ත්වය නව උපධිධාරීන් තුළ පමණක් නොව මීට වසර ගණනාවට පෙර උපාධිධාරීන් වශයෙන් පත් වීම් ලැබ විවිධ රැකියාවන්හි නිරත වූවන් තුළින් ද හඳුනා ගත හැකිය. මේ පිළිබඳව සමීක්ෂණය සිදු කිරීමේදී එක් ක්ෂේත්‍රයකට පමණක් සීමා වීම මඟ හරවා ගැනීම උදෙසා රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ හා පශු වෛද්‍ය කාර්යාලයේ සේවයේ නියුතු නව උපාධිධාරීන් සහ සේවා කාලය වසර 20 ඉක්මවූ විවිධ පුද්ගලයන් පහසු නියැදීම යටතේ සමාන නියෝජනයක් සිදුවන සේ තෝරා ගෙන සම්මුඛ සාකච්ඡා මාර්ගයෙන් තොරතුරු ලබා ගන්නා ලදී. සම්මුඛ සාකච්ඡා මගින් ලබා ගත් තොරතුරුවලට අනුව පැහැදිලි වූයේ උපාධිධාරීන් වශයෙන් රැකියා ලබා ගත් බොහොමයක් පිරිසකට තමන් උපාධි අපේක්ෂකයෙකු වශයෙන් සිටි කාලය තුළ හැදෑරූ කිසිදු අධ්‍යයන විෂයක් තම රැකියාවට අදාළ නොවීමත් තවත් පිරිසකට තමන් කිසිදු දිනක අධ්‍යයනය නොකළ කිසිදු අවබෝධයක් නොමැති විෂය ක්ෂේත්‍ර හිමි වී තිබීමත් හේතුවෙන් මොවුන් විශාල වශයෙන් රැකියාව තුළ දී ගැටලුකාරී තත්ත්වයකට මුහුණ දීමට සිදුව තිබේ. එමෙන්ම මොවුන් විශාල වශයෙන් මානසික අපහසුතාවයකට ද පත්ව තිබේ. ඇතැම් අවස්ථාවන්හිදී රැකියා ක්ෂේත්‍රය අත්හැරීමට ද මෙය හේතු සාධක වී තිබේ.

**මුඛ්‍ය පද :** උපාධිධාරියා, අධ්‍යයන විෂයන්, රැකියා

[1] ආර්ථිකවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, nimanthisomasiri@gmail.com